# නිවේදනය යි!

**1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් (Authorized Officers) සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් (Officers Authorized to Institute Proceedings & Conduct Prosecutions) වෙත:**

Carbofuran 3% GR නමින් කාබොෆියුරාන් 3%ක් අඩංගු යැයි සඳහන් නීතිවිරෝධී නිෂ්පාදනයක් බෙදා හැරීම හා අලෙවි කිරීම.

අංක 1999/33 සහ 2016.12.28 දින රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි **කාබොෆියුරාන්** නිෂ්පාදන 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 14 සහ 15 වන වගන්ති ප්‍රකාරව නීතිවිරෝධී පළිබෝධනාශක නිෂ්පාදන ලෙස සැලකිය යුතුය. එහෙත්, AWINER BIOTECH ආයතනයක් නමින් ඉන්දියාවේ නිෂ්පාදිත යැයි සැක කළ හැකි කාබොෆියුරාන් 3%ක් අඩංගු යැයි සඳහන් නීතිවිරෝධී නිෂ්පාදනයක් බෙදා හැරීම හා අලෙවි කිරීම සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වෙත මූලික තොරතුරු අනාවරණය වී ඇත (ඇමුණුම 1).

ප්‍රධාන වශයෙන් මැදිරිගිරිය ප්‍රදේශයෙන් හමු වී ඇති මේ සමඟ දැක්වෙන **Carbofuran 3% GR** නීතිවිරෝධී නිෂ්පාදනය පිළිබඳව පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් හා නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ සියළුම බලයලත් නිලධාරිවරුන් අවධානයෙන් සිටින ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ. සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2020 දෙසැම්බර් මස 03 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076 Mobile 0772363824




ඇමුණුම -1 Carbofuran 3% GR නමින් කාබොෆියුරාන් 3%ක් අඩංගු යැයි සඳහන් නීතිවිරෝධී නිෂ්පාදනය